17/10/2010 - ඉරිදා ලංකාදීප

**දෙටු පුරවැසියන් සංවර්ධනයට දායක කරගනිමු - මිලින්ද මොරගොඩ**

ජාත්‍යන්තර ළමා දිනය හා වැඩිහිටි දිනය යෙදී තිබුණේ පසුගිය සතියේ එකම දිනයකදීය. දරුවන් ගැන වැඩි අවධානයක් යොමුවිය. දරුවන්ට හොඳම දේ දෙන සංස්කෘතියක් ඇති සමාජය වැඩිහිටියන්ට වඩා දරුවන්ගැන වෙනදාට වඩා කතා කළේය. අනාගතය දරුවන්ගේය. දරුවන් රටට සම්පතකි. දරුවන්ගේ අනාගතය අනතුරකට පත් නොකරන වගකීමක් අපට ඇත. සමීක්ෂණ හා පර්යේෂණ වාර්තා අනුව ශ්‍රී ලංකාවේ දරුවන්ට අනාගතයේ දී මුහුණපාන්නට සිදුවන බරපතල ප්‍රශ්නයක් තිබේ. එය වැඩිහිටියන්ය. හෙට පරම්පරාවේ දරුවන්ට තම වැඩිහිටියන් රැක බලා ගැනීම ගැටලුවක් වන්නේ ඇයි? එයට හේතුව ප්‍රතිශතයක් වශයෙන් වැඩ කළ හැකි ශ්‍රම බලකායට වඩා රැකබලා ගන්නා පිරිස ඉහල යා හැකි බව පර්යේෂකයන් විසින් අනතුරු ඇඟවීමයි.

ශ්‍රී ලංකාව දෙදහස් හයසිය වසරක ඉතිහාසයක් ප්‍රෞඪත්වයක් ඇති රටකි. ආඩම්බරවිය හැකි සංස්කෘතියක් අපට තිබේ. මෙම සංස්කෘතිය හා සදාචාරය විසින් අපට උගන්වා ඇති පාඩම නම් වැඩිහිටියන්ට ගරු කිරීමයි. ඔවුන් සැපවත්ව බලා ගැනීමයි. දරුවන් හා වැඩිහිටියන් ට ආරක්ෂාව ලැබිය යුතුය. ආහාර පාන හා බෙහෙත් හේත් සැපයිය යුතුය. තමන්ටම එවැනි අවශ්‍යතා සපුරාගත නොහැකි දරුවන් හා වැඩිහිටියන් යැපෙන්නේ වැඩ කරන එයින් ආදායමක් උපයන කණ්ඩායමේ ආදායමෙනි. තවත් අවුරුදු දහයකින් දොලහකින් පසු මේ සමාජ පැවැත්ම අභියෝගයකට ලක්වන්නට ඉඩ තිබේ. එසේ විය හැකි බවට සාධක මතුවෙමින් පවතී. දැනට වැඩකරන පුද්ගලයෙකුට දරුවන් හා වැඩිහිටියන් රැකබලාගත යුතු සංඛ්‍යාව තව දශක දෙකක් පමණ වන විට වැඩි වෙයි. ඒ අනුව පවුලක සැමියා හා බිරිඳ උපයන දෙයින් අදට වඩා දරුවන් හා දෙමාපියන් නඩත්තු කරන්නට වැයකරන්නට සිදුවන අතර ආර්ථික සංවර්ධනයක් සිදුවී ලැබෙන ආදායම වැඩි නොවුනහොත් එය සාමාන්‍ය ආදායම් ලබන පවුලකට දරාගත නොහැකි එකක් වනු නොඅනුමානය.

එහි අනිවාර්ය ප්‍රතිඵලය වනු ඇත්තේ කුමක්ද? මෙතෙක් පැවති සමාජ සම්බන්ධතා බිඳ වැටීමයි. වැඩ කළ හැකි පිරිස ලබන ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ඔවුන්ට දරුවන් සමග වැඩිහිටියන් ද නඩත්තු කළ නොහැකිය. වැඩිහිටියන් ඒ වෙනුවෙන් වෙන්කරන ලද වැඩිහිටි නිවාස වලට යවන්නට සිදුවිය හැකිය. දැනට මේ වැනි වැඩිහිටි නිවාස මේ රටේ ඇත. ඒවායේ ජීවත්වන්නේ රැකබලාගන්නට කිසිදු කෙනෙකු නැති අසරණ පුද්ගලයන්ය. රජය හා සමාජසේවා ආයතන ඒවා පවත්වාගෙන යයි. එනමුත් අපට පෙනෙන අනාගතයේ දී වැඩිහිටියන් බවට පත්වෙමින් සිටින අපට අපේ දරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් නැති හෙයින් වැඩිහිටි නිවාසයකට වී ජීවත්වන්නට සිදුවුවහොත් ඇතිවන මානසිකත්වය කෙබඳුද? වැඩිහිටියන් නොඑසේනම් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යනු තවදුරටත් රටට මෙහෙවරක් කළ නොහැකි සමාජයේ යැපෙන ජන කොටසක් සේ ගැනෙන පාර්ශවයක් පමණක් විය යුතුද?

මේ පෙන්වන පින්තූරය අනුව වැඩිහිටියන්, තව දුරටත් ආදායමක් උපයන පිරිසක් විය යුතුය. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය දළ වශයෙන් සියයට හයක ප්‍රතිශතයක පසුගිය වසර කිහිපය තිස්සේ පැවතින. මෙම ප්‍රතිශතය කෙසේවත් ප්‍රමාණවත් එකක් නොවේ. එදිනෙදා අවශ්‍යතා සපුරාගනිමින් යන්තමින් ජීවත්වන සමාජයකට මේ වර්ධනය ප්‍රමාණවත්ය. අවම වශයෙන් සියයට දහයක හෝ දොලහක වර්ධනයක් රට විසින් ලඟා කරගත යුතුව තිබේ. ඒ ආර්ථික වර්ධනය නිසා මහජනතාවගේ අතට ලැබෙන ආදායම වැඩිවන අතර එය පවුලේ දරුවන් හා වැඩිහිටියන් නඩත්තුවට සෑහේ. එවිට සමාජයට දියුණු රටක පුරවැසියන්ට දැනෙන සෞභාග්‍යය දැනෙනු ඇත. එය කළ හැකි දෙයකි. අවශ්‍ය ප්‍රතිපත්ති තීන්දු ගැනීමෙන් හා ප්‍රතිසංස්කරණ ඔස්සේ මෙම ආර්ථික වර්ධනය උදාකරගත හැකිවේ. තිස් වසරක පමණ කාලයක් මෙරට ආර්ථිකයෙන් සෑහෙන කොටසක් විනාශවූයේ නිරර්ථක යුද්ධයක් වෙනුවෙනි. ගැටම් නිසා මෙරට ධනය විනාශ වූවා පමණක් නොව ආයෝජන ද සීමා විය. සාමය උදාවීම සමග මෙම අහිමි වී ගිය අවස්ථා යළි පුනර්ජීවනයකට ලක් කරගත හැකිය. එහෙත්

පර්යේෂකයන් පෙන්වා දෙන්නේ අප ඉතාමත් ඉක්මනින් තීරණ ගත යුතුව ඇති බවයි. එසේ වී ඇත්තේ ජනගහනයේ ශ්‍රම බලකාය සීමාසහිත වෙමින් පවතින හෙයිනි.

ආර්ථික වර්ධනය සීමාසහිත වුවත් දියුණු රටකට සමාන හොඳ අධ්‍යාපනයක් හා සෞඛ්‍ය පහසුකම් නිසා ජනගහන වර්ධනය සීමා විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් උපත් අඩු වී ජීවිත කාලය වැඩිවීම නිසා වර්තමානයේ ඇති ශ්‍රම ජනගහනය අඩු වීමේ කාරණය මතුව පෙනේ. මේ නිසා ආර්ථිකය සීමාසහිත එහෙත් දියුණු රටක වැනි වැඩි වයස්ගත ජනගහනයක් සිටින අවස්ථාවකට අප මුහුණ දෙමින් සිටී. එය නොගැලපෙන එකකි. දැනටමත් නාගරික සමාජයේදී ජ්‍යෂ්ඨ පුරවැසියන්ට ලැබෙන සැලකිලි ගැන ප්‍රශ්න තිබේ. මේවා නොරිස්සුම් සහගත හෝ දරාගත නොහැකි ඒවා වන්නට හැකිය. අනෙක් අතට ඒවායේ ප්‍රතිශතය ඉතාමත් සීමිත බව නොඅනුමානය. නමුත් ආදයම අඩුවී යැපෙන පිරිස වැඩිවන විට ඕනෑම පවුල් ඒකකයක ගැටුම් ඇතිවෙයි. නොගැලපෙන තැන් ගැන වැඩි වී බේධ භින්නවීම් ගැන ඇසෙන්නට ඉඩ තිබේ. සමාජයක් වශයෙන් අප පියවර ගත යුතුව ඇත්තේ එදිනෙදා පවතින ප්‍රශ්න වලට පමණක් නොවේ. අනාගතයේ දී මුහුණ දෙන්නට සිදුවන මෙවැනි අභියෝග ගැන තියුණු විශ්ලේෂණයක නිරත වී ඒවාට ලබා දිය හැකි විසඳුම් ගැන කල්තබා සූදානම්වීම වැදගත්ය. මෙයට කලින් සමාජයට මුහුණ දෙන්නට සිදුව තිබුණේ යුධ අත්‍ර්‍යාකීමටය. රටත් නායකයනුත් යුධ විසඳුම වෙනුවෙන් සම්පූර්ණ අවධානය යොමු කළේය. යුද්ධය අවසන් වීම සමග සමාජයේ මෙතෙක් අවධානයට ලක් නොවූ පැති ගැන සැලකිල්ලක් දක්වන්නට සිදුවෙයි.

ශ්‍රී ලංකාවට ඉක්මන් සංවර්ධනයක් ලබා ගතයුතු නම් හා යැපෙන පිරිස ඉදිරි දශකය හෝ දෙක අතරතුර ඉහල යන්නේ නම් වගකිවයුතු සමාජයක් වශයෙන් අපට ගන්නට ඇත්තේ එක් තීන්දුවකි. එය නම් යැපෙන පිරිසගෙන් යම් කොටසක් ද නැවත නිෂ්පාදන කාර්යයට නිසි ලෙස දායකකරගෙන නිපැයුම් වැඩිකර ගැනීමයි. ආදායම් නංවන ව්‍යාපෘති වලට තව ශ්‍රමය එකතු කරගැනීමයි.

මේ නිසා රජයේ හෝ පුද්ගලික අංශයේ සේවයෙන් පසු විශ්‍රාම යන පිරිස යළි සේවය ලබාගත හැකි තැන් වලට යොමු කළයුතු වෙයි. විශ්‍රාම යා යුතු වයස අවුරුදු හැට පහ හැත්තෑව දක්වා වැඩි කරන්නට සිදුවෙයි. දැනට ශ්‍රී ලංකාවේ පවතින්නේ රැකියා හිඟයකි. විශ්ව විද්‍යාල උපාධිධාරීන් පවා රැකියා නොමැතිකම නිසා රජයට විරෝධතා එල්ල කරන, උපවාස අරඹන මට්ටමට පත්ව තිබේ. වැඩි දෙනෙක් ඉල්ලන්නේ ආණ්ඩුවේ රැකියා බව පෙනේ. සංවර්ධනය වෙමින් පවතින රටකට ෆ්‍රීරිය හැකි මට්ටමට වඩා රාජ්‍ය සේවක පිරිසක් දැන් රජය ට සේවය කරයි. මේ සේවාව කාර්යක්ෂම හා ඵලදායීතාවයෙන් ඉහල යා යුතුය. රජයේ සේවය පලදායීතාවයෙන් හීන අකාර්යක්ෂම එකක් වන විට එහි අවාසිය එකතු වන්නේ සමාජයටය. රජයේ සේවයට ගෙවන්නේ මහජනතාව ගෙවන බදු වලිනි. රජයේ සේවය කරන පිරිස වැඩි වන විට ගෙවන්නට සිදුවන බදු බර වැඩි වෙයි. අනාගතයේ දී යැපෙන පිරිස වැඩිවන සමාජයක් තුළ තව තවත් රජයේ සේවකයන් නඩත්තු කරමින් වැඩි වැඩියෙන් බදුගෙවන්නට ශ්‍රම බලකායට නොහැකි වනු ඇත. මේ නිසා කළ යුත්තේ හැකිතාක් කාර්යක්ෂම හා කුඩා රජයේ සේවයක් පවත්වාගෙන යාමයි. රජයේ සේවය කුඩා වන විට එයට බඳවා ගැනීම් අඩුවෙයි. විශ්‍රාම යා යුතු වයස වැඩි කරන අතර තුර තවත් රැකියා සපයමින් රාජ්‍ය සේවය පවත්වාගෙන යන්නට ප්‍රායෝගිකව හැකියාවක් නැත.

මේ අනුව ප්‍රතිපත්ති සම්පාදකයන්ට මතුවන ගැටලුවක් තිබේ. යැපෙන පිරිස අඩු කර ගැනීමට විශ්‍රාමික පිරිසට ද රැකියා දිය යුතුය. ඒ අතරම රජයේ සේවය ද සීමා කළ යුතුවේ. මේ අලුත් රැකියා සොයා ගන්නේ කොතැනින්ද? දියුණුවන රටක් වශයෙන් අලුත් අලුත් ව්‍යවසාය සොයා යායුත්තේ මේ නිසාය. කෘෂිකර්මයේ, ධීවර කර්මාන්තයේ, සංචාරක ව්‍යාපාරයේ හෝ වෙනත් ව්‍යාපාර වඩා පුලුල්විය යුතුය. ශ්‍රමිකයන් ප්‍රමාණාත්මකව නැතිවන විට කෘෂිකර්ම අංශය වැඩි දියුණු කළ නොහැකිය. දැන් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට වැඩි වශයෙන් දායක වී ඇත්තේ සේවා අංශය විනා කෘෂිකර්ම අංශය නොවේ. ලෝකයේ විශාල වශයෙන් ආහාර නිපදවන රටවල් සමග තරඟකාරී ලෙස කෘෂිකර්ම අංශයෙන් ක්‍රියා කරන්නට අපට හැකියාවක් නැත.

එහෙත් අවධානයට ලක් නොවූ පැති සොයා යාමෙන් අලුත් ව්‍යාපාර බිහිකර ගත හැකිය. ධීවර කර්මාන්තයේ ද ඇස නොගැටුන අලුත් පැති සොයා යා යුතුය. මසුන් ඇල්ලීම පමණක් නොව මත්ස්‍ය වගාව, ඉල්ලුමක් ඇති මසුන් තෝරාගත් රටවලට යවා වැඩි ආදායම් ඉපැයීම වැනි පැති අලුතින් අවධානයට ලක් කළ හැකිය. තරුණන්ට හා රැකියා සොයා යන පිරිසට අලුත් ආයෝජන හා ව්‍යාපාර අවස්ථා ඇති කරන්නට අනුබල දිය යුතුය. වඩා පහසුකම් හා දිරිගැන්වීම් සැපයීමෙන් ආර්ථිකය ප්‍රසාරණය වන ඉඩ බහුල කළ යුතුය. නිදහස ලබන විට ශ්‍රී ලංකාව පැවතියේ කෘෂිකර්මය පදනම් කරගත් තේ, රබර් හා පොල් අපනයන ආර්ථිකයකි. එනමුත් අසූවේ දශකයෙන් පසු විදේශ රැකියා, ඇඟලුම් වැනි අලුත් අවස්ථා බිහිවිය. දැන් ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය ශ්‍රමය හිඟ වෙමින් පවතී. රටේ දක්ෂ ශ්‍රමිකයන් තව දුරටත් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස මැදපෙරදිග ඇතුලු රටවලට යවා යැපෙන්නට ඉඩ දීම යුක්ති සහගත නැත. එපමණක් නොවේ රටේ ආර්ථිකය දියුණු වන විට විදේශ ශ්‍රමිකයන් පවා මෙරටට පැමිණෙන්නට ඉඩ තිබේ. දැනටමත් නොයෙක් අංශවල විදේශිකයන් සේවය කරති. මෙකී තත්ත්වයට ගැලපෙන පරිදි සැලසුම් වෙනස්වීම අවශ්‍යය. මේ නිසා හැකිතාක් පුද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම කළ යුතුය. වඩා වැදගත් වන්නේ විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීමයි. තරඟකාරී හා අවස්ථාව ඇති රටකට විදේශ ආයෝජන දිනාගැනීම අසීරු නැත. ආයෝජන ආකර්ශවය වන අන්දමට ප්‍රතිපත්ති සම්පාදනය කරන විට හා නිසි යටිතල පහසුකම් නංවා විශ්වාසය ඇති කළ විට ආයෝජන වැඩිවෙයි.

අලුතින් රැකියා උත්පාදනයක් නොවී දැනට පවතින රැකියා වල යෙදී සිටින පිරිස් විශ්‍රාම නොගන්වා සිටීම එළැඹෙන වැඩි වයස් ජනගහන ප්‍රශ්නයට පිළියම නොවේ. මෙහිලා ප්‍රයෝජනවත් වන අලුතින් රැකියා සැපයෙන මුලින් සඳහන් කළ ආකාරයේ අවස්ථා විවරවිය යුතුය.

වෙහෙසකින් තොරව කාර්යාලයේ සිට පරිගණක ආශ්‍රිතව වැඩසටහන් සම්පාදනය හා ඒ ආශ්‍රිත සේවා සැපයීම මෙම ක්ෂේත්‍රයේ දැන් ඇතිවෙමින් තිබෙන අලුත් අවස්ථාවන්ය. බංගලාදේශය හා ඉන්දියාව දැනට වේගයෙන් මෙම සංක්‍රමණ අවස්ථාවට මුහුණදෙමින් සිටින බව වාර්තාවෙයි. ආසියානු කලාපයේ රටක් වශයෙන් මේ රටවල අත්දැකීම් ලංකාවට ද ප්‍රයෝජනවත් විය හැකිය. එසේම මෙරට ජනගහනය සතු අධ්‍යාපන පසුබිම හා අධ්‍යාපනය අනුව සලකනවිට මෙවැනි තොරතුරු තාක්ෂණ අංශයේ රැකියා කෙරෙහි වැඩි වයස් ජනගහනයට ඉක්මනින් හුරු විය හැකිය.

මේ හා සමාන්තරව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව ගැන අවධානය යොමුකරන වැඩපිළිවෙලක්, ඔවුන්ගේ අසනීප හා රෝගාබාධ ආදියට තවත් කෙනෙකුට බරක් නොවී රක්ෂණය වැනි ආයෝජන මාර්ග ඔස්සේ විසඳාගත හැකි නව සැලසුම් ඉදිරිපත් විය යුතුව තිබේ. දැනට මෙවැනි අලුත් රක්ෂණ හා සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙල සම්බන්ධ ව්‍යාපාර බිහිවෙමින් පවතී. මේවා හුදෙක් රජයේ මැදිහත් වීමෙන්ම පමණක් ඉටුවිය යුතු කාරණා නොවේ. පුද්ගලික අංශයට සමාජ සංවිධාන වලට මේ වෙනුවෙන් එකතු විය හැකිය. නව ව්‍යාපාර හා ව්‍යවසාය බිහිකර ගත හැකිය.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ගේ ප්‍රශ්නය ගැන මෙයට වඩා පුලුල් දැක්මක් ඇතිව විසඳා ගැනීමට අවශ්‍ය මාවත පිළියෙල කර ගැනීම කෙරෙහි ආගමික නායකයින් හා සමාජ සංවිධානයන්හි අවධානය ද වැදගත්ය. ජ්‍යෙෂ්ඨ පුරුවිසියන් පන්සල, පල්ලිය, කෝවිල හා දේවස්ථානය සමග සමීපව සිටී. නිරෝගී දෙටු පුරවැසියන්ට සමාජයෙන් යැපෙන්නට නොව විකල්ප ආදායම් අවස්ථා සොයායමින් දරුවන්ට බරක් නොවී ජීවත්විය හැකි අන්දම ගැන උපදෙස් ලැබිය යුත්තේ මේ ආගමික පරිසරයෙන්ය. ආර්ථිකයේ ඇතිවන දුෂ්කරතා පවුලේ ආදායම සමග තේරුම් ගන්නට හැකි පසු බිමක් සැකසීම අවශ්‍යය. ආර්ථිකය වේගයෙන් දියුණු විය යුතු අතර එසේ දියුණු වුවහොත් අලුතින් ඇතිවන අවස්ථා පමණක් නොව එසේ නොවුනහොත් එවැනි දුෂ්කරතා හමුවේ ජීවත්වන ආකාරයත් අප කල්තබා අවබෝධයෙන් සිටීම අවශ්‍යය.

අවසාන පණිවුඩය නම් සමාජයේ දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ට හිමිවියයුතු සම්භාවනීයත්වය ආරක්ෂා කිරීම හා ඔවුන් බලගැන්වීම උදෙසා අප බැරෑරුම් පියවර ගත යුතුව තිබේ. අලුත් ගැටලුව ගැන පොදුව සිතන සාමූහිකව තීන්දු ගන්නා දීපව්‍යාප්තව ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන ජාලයක් ස්ථාපිත කිරීමට අපට හැකි විය යුතුය. එපමණක් නොවේ. ජ්‍යෙශ්ඨ පුරවැසියන්ගේ ගැටලු අධ්‍යයනය, රටේ වැඩි වයස් ජනගහනය වැඩි වන විට කළ යුතු වෙනස්කම් සම්බන්ධයෙන් අවබෝධයක් ඇති විශේෂඥ පුද්ගලයන්ගෙන් සමන්විත බලගතු ආයතනයක් ස්ථාපිත වීම අවශ්‍යය. තොරතුරු එකතු වී පර්යේෂණ කර වෙනස්වන සමාජයට අවශ්‍ය තීන්දු ගන්නට පිහිටුවන එවැනි ඒකකයක් අමාත්‍යංශයකට සම්බන්ධ කළ හැකිවේ. එවිට ඔවුන්ගේ අවශ්‍යතා මෙන්ම ඔවුන් ආණ්ඩුවෙන් හෝ සමාජයෙන් අපේක්ෂා කරන පහසුකම් ගැන සංවාදයක් ඇරඹිය හැකි වනු ඇත.

ඒ සඳහා සිතන්නට හා වැඩ පිළිවෙලක් අරඹන්නට සමාජයට ආත්ම ශක්තිය තිබිය යුතුය. ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවබෝධයක් ඇතිවීම අවශ්‍යය. සමාජය දැනුම්වත් විය යුතුය. වඩා වැදගත් කරුණ නම් සමාජයේ ජ්‍යෙශ්ඨ පුරවැසියන් තමන්ට බලපාන මෙම පැති ගැන කතා කිරීම අවශ්‍යය. මෙම ලිපිය කියවන දෙටු පුරවැසියන්ට තමන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කළ හැකිය. සාමාන්‍යයෙන් වැඩිහිටි දිනය සමරා අවුරුද්දකට වතාවක් මේ ගැන කතා කරන සම්ප්‍රදායෙන් එපිටට යන වෑයමක් බවට මෙය පත් කළ හැක්කේ එවැනි පිබිදීමක් ඇති කළහොත් පමණකි.